**මහනුවර මහා නගර සභාව - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මහනුවර මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට බාහිර පාර්ශවයන් 43 ක් මහා නගර සභාව වෙත සහ මහා නගර සභාව විසින් බාහිර පාර්ශවයකට නඩු පවරා තිබුණු අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී පෙන්වා දී ඇති අඩුපාඩුව ඉදිරියේ දී නිවැරදි කරන බව. | තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ රු.204,946,131 ක මුද්දර ගාස්තු සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගලපන ලද මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කළ ආදායම රු.339,214,127 ක් වුවත්, එය රු.337,462,756 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් වරිපනම් බදු රු.1,751,371 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී, ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ හිටි වෙළඳ බලපත්‍ර හා කර්මාන්ත බදු රු.412,900 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල්වලින් අය කළ බදු ආදායම රු.5,294,738 ක් වුව ද, එය රු.5,768,120 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, වර්ෂයේ ආදායම රු.473,382 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂය වෙනුවෙන් ගලපන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වීථි පහන් නඩත්තුව වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයෙන් රු.1,247,474 ක් ලැබිය යුතු වුව ද, එය රු.663,320 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් ආදායම් ණයගැතියෝ රු.584,154 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මධ්‍යම වෙළඳ පොළේ හා සංඝරාජ මාවතේ කඩ 18 කින් ලැබිය යුතු ටෙන්ඩර් මුදල් රු.10,932,316 ක් හා කඩ කුලී රු.1,295,345 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ටෙන්ඩර් මුදල් හා කඩ කුලී ආදායම් ඉදිරියේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කර ගිණුම් ගැලපීමට පියවර ගන්නා බව . | -එම- |
| (උ) | මහනුවර වාණිජ මධ්‍යස්ථාන (MCC) ගොඩනැගිල්ලේ සමාලෝචිත වර්ෂයට අදාළ කුලී ආදායම රු.110,235,206 ක් වුවත්, එය රු.106,773,224 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් කුලී ආදායම රු.3,461,982 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කරන බව. | -එම- |
| (ඌ) | සංචාරක බෝට්ටු සේවාවේ සමාලෝචිත වර්ෂයට අදාළ රු.319,551 ක ආදායමින් ඉදිරි වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.351,506 ක් අඩුකර සමාලෝචිත වර්ෂයේ ආදායම රු.31,955 ක සෘණ අගයක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන්, වර්ෂයේ ආදායම රු.351,506 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම අඩුපාඩු අතපසුවීමක් මත සිදු වී ඇති බවත්, එය ජ'නල් සටහන් මඟින් නිවැරදි කළ බව. | -එම- |
| (එ) | අප ජල ව්‍යාපෘතියට අදාළ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවැති කර්මාන්ත ණයගැතියෝ රු.9,997,370 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළව ලැබිය යුතු අප ජල ආදායම ඉදිරියේ දී නිවැරදි කර ගන්නා බව. | -එම- |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොහාගොඩ කොම්පෝස්ට් අංගනයේ පැවැති රු.8,573,500 ක ඇසුරුම් කළ හා නොකළ කිලෝ ග්‍රෑම් 342,300 ක පොහොර තොගය ගිණුම්ගත කර නොතිබුණි. | පොහොර තොගයේ වටිනාකම ඉදිරියේ දී ජ'නල් සටහන් මඟින් නිවැරදි කරන බව. | තොග නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඓ) | ඉකුත් වර්ෂයේ දී, එකතුව රු.27,838,724 කට ගිවිසුම්ගතව තිබුණු ව්‍යාපෘති 02 ක සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට තවදුරටත් ගෙවිය යුතු මුදල් එකතුව රු.27,838,724 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට පියවර ගන්නා බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල රු.2,119,255 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂය වෙනුවෙන් ගලපන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඕ) | වාර්ෂික අයවැය ලේඛනයේ වැය විෂයයන් 06 කට සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඉතිරිව තිබුණු ප්‍රතිපාදන එකතුව රු.15,225,000 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට සාවද්‍ය ලෙස ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂය වෙනුවෙන් ගලපන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන බව. | -එම- |
| (ඖ) | වාර්ෂික අයවැය ලේඛනයේ වැය විෂයයකට වෙන් කර තිබුණු රු.7,000,000 ක ප්‍රතිපාදන මුදල සාවද්‍ය ලෙස ණයහිමි කර තිබිය දී, එම වැය විෂයය යටතේ සමාලෝචිත වර්ෂයේ ක්‍රීඩා භාණ්ඩ මිලදී ගෙන ගෙවිය යුතු රු.5,668,780 ක් නැවත ණයහිමි කර තිබුණි. | වැඩිපුර දක්වා ඇති ණයහිමි ශේෂය ඉදිරියේ දී ජ'නල් සටහන් මඟින් ගැලපීමට පියවර ගන්නා බව. | -එම- |
| (ක) | සමාලෝචිත වර්ෂයේ ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම සඳහා වැය කර තිබුණු රු.3,617,490 ක් ප්‍රාග්ධනීත කර නොතිබුණි. | ක්‍රීඩා උපකරණවල වටිනාකම ඉදිරියේ දී ප්‍රාග්ධනීත කරන බව . | -එම- |
| (ඛ) | සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලැබී තිබුණු මෝටර් රථ 02 අගය රු.11,000,000 ක් ප්‍රාග්ධන ආදායම් හා වියදම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ආදායම් වියදම් ගිණුමෙහි පරිත්‍යාග, ආදායමක් ලෙස ගිණුම්ගත නොකළ බව . | -එම- |

1.6.3 **නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් 02 ක හා බැරකම් විෂයයන් 08 කට අදාළ උපලේඛනවල සඳහන් ශේෂ සමඟ සැසඳීමේ දී, රු.752,466,541 ක නොසැසඳීමක් විය. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරන විට මෙම නොසැසඳූ ගිණුම් ගලපා නිවැරදි උපලේඛනය ලබා දීමට පියවර ගන්නා බව . | වෙනස්කම් හඳුනා ගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන යෙදුමට ආදායමින් හා පරිත්‍යාගයෙන් දායක වීමේ ගිණුම්වල ශේෂය හා මුළු ස්ථාවර වත්කම්වල ශේෂය අතර රු.927,689,766 ක වෙනසක් විය. | මෙම ගිණුම් ශේෂ 02 අතර වෙනස ස්ථාවර වත්කම් යටතේ සඳහන්ව ඇති ගොඩනැගිලිවල වටිනාකම බව. | -එම- |

1.6.4 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.606,081,324 ක් වටිනා ගිණුම් ශේෂ 05 ක් ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවි කිරීම් ගිණුම මේ වන විට සකස් කරමින් පවතින අතර, පොදු ගබඩා, ජල කර්මාන්ත ගබඩා, ලිපි ද්‍රව්‍ය ගබඩා ගිණුම් සමීක්ෂණය අවසන් වූ වහාම ලබා දෙන බව. | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට ලේඛන පවත්වා ගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනත | | | |
| | 16(2) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කාර්යයසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | මහා නගර සභා ආඥා පනත | | | |
| (i) | 234(2) වගන්තිය | 2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ ගොඩනැගිලි සංවර්ධන බලපත්‍ර 1062 ක් නිකුත් කර තිබුණ ද, ඉන් ඉදිකිරීම් 860 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | අනුකූලතා සහතික ලබා ගැනීම මග හැර ඇති පුද්ගලයින් වෙනුවෙන් ක්‍රියාමාර්ග ගන්නා බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 266(අ) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ දී, ආදායම් විෂයයන් 06 ක රු.57,538,128 ක හිඟ ගාස්තු කපා හැර තිබුණ ද, ඒ සඳහා මහා සභා අනුමැතිය හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | පසුගිය වසර කිහිපයකදීම කේවළ ශේෂ හා ඉදිරියට ගෙන ආ ශේෂ අතර වෙනස්කම් පවතින බැවින්, ආදායම් නිවැරදිව ගිණුම්ගත කිරීමේ අරමුණින් ශේෂයන් කපා හැර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1978 අංක 42 දරන පළාත් පාලන ආයතන නිල නිවාස සන්තකය ආපසු ලබා ගැනීමේ පනත | | | |
| | 03(iv) ඡේදය | අරුප්පල ජාතික නිවාස සංකීර්ණයේ සභාවට අයත් රජයේ නිවාස 10 ක පදිංචි වී සිට දැනට විශ්‍රාම ගිය නිලධාරීන්ගේ සන්තකය ආපසු පවරා ගෙන නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.619,688 ක හිඟ කුලී අය කර නොතිබුණි. | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බව. | සන්තකය ආපසු පවරා ගත යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජල අංශය විසින් ආදායම් ලෙස රැස් කරනු ලබන දඩ ගාස්තු (Surcharge) නැවත සන්ධි කිරීමේ ගාස්තු (Reconnection fees) සහ ජල බිල්පත් ගැලපීම් (Adjustment) ගාස්තු යටතේ වූ පාරිභෝගිකයින්ගෙන් එකතු කර ගනු ලබන වැට් බදු මුදල් ආදායමට අදාළව වටිනාකම නිවැරදිව හඳුනා ගෙන නොමැති බැවින්, 2022 වර්ෂයේ පළමු කාර්තු 03 සඳහා රු.1,402,548 ක වැට් බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත | අය කළ මුදල් ප්‍රේෂණය කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.627,188,401 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.565,729,320 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අගරු චෙක්පත් ලේඛනයට අනුව, 2015 වර්ෂයේ සිට 2022 වර්ෂයේ මැයි මස දක්වා කාල පරිච්ඡේදයට අදාළ ජල පාරිභෝගිකයින්ගේ ජල ගාස්තු අය කිරීම සඳහා ලබා ගෙන තිබුණු රු.4,427,181 ක චෙක්පත් 197 ක් අගරු වී තිබුණි. මෙම අගරු චෙක්පත් සම්බන්ධව කිසිදු ගැලපීමක් සිදු කර නොමැති බැවින් ජල පාරිභෝගිකයින්ගෙන් ලැබිය යුතු සේ සළකා ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මහා නගර සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි. | ජල පාරිභෝගිකයින් විසින් ගෙවන ලද චෙක්පත් අගරු වීමේ දී එම වටිනාකම් අගරු චෙක්පත් ගිණුමක් මඟින් ගැලපීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ලංකා බැංකුවෙහි හා මහජන බැංකුවෙහි පවත්වා ගෙන යන ජංගම ගිණුම් 02 ක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව, එකතුව රු.22,826,646 ක හඳුනා නොගත් තැන්පතු, එකතුව රු.527,314 ක හඳුනා නොගත් ගෙවීම් හා තැන්පත් කළ නමුත්, දීර්ඝකාලයක සිට උපලබ්ධි වී නොතිබුණු රු.1,015,214 ක් නිරවුල් කර නොතිබුණි. | හඳුනා නොගත් තැන්පතු නිරවුල් කිරීමට ද, හඳුනා නොගත් ගෙවීම් නිරවුල් කිරීමට ද, උපලබ්ධි නොවූ චෙක්පත් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | හඳුනා නොගත් ශේෂ නිරවුල් කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | ආදායම් වෙනුවෙන් ලැබී තිබුණු රු.3,452,525 ක අගරු චෙක්පත් 104 ක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මිශ්‍ර ආදායම් අංශයේ රු.1,916,219 ක මුදල සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ද, ජල හා වරිපනම් අගරු චෙක් සඳහා අදාළ පාරිභෝගිකයාගෙන් අය කිරීමට කටයුතු කරන බව. | අගරු චෙක්පත් සම්බන්ධව නිසි පියවර ගත යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තුගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස් කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 990,201,000 | 882,283,117 | 820,914,617 | 589,194,812 | 1,037,531,000 | 762,281,380 | 765,883,323 | 527,826,312 |
| (ii) | කුලී | 285,829,000 | 253,894,168 | 233,732,302 | 131,724,666 | 356,140,000 | 99,354,750 | 666,440,065 | 111,562,800 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 40,305,000 | 34,770,109 | 34,770,109 | -- | 45,306,000 | 36,208,570 | 36,208,570 | -- |
| (iv) | වෙනත් ආදායම් | 908,667,000 | 746,595,031 | 592,026,297 | 280,141,845 | 955,493,000 | 686,288,900 | 434,197,593 | 125,573,111 |
| | එකතුව | 2,225,002,000 | 1,917,542,425 | 1,681,443,325 | 1,001,061,323 | 2,394,470,000 | 1,584,133,600 | 1,902,729,551 | 764,962,223 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**<br>සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.764,962,223 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එය රු.1,001,061,322 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 31 ක් විය. | හිඟ ආදායම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව | හිඟ ආදායම් අය කර ගත යුතුය |
| (ආ) | **වරිපනම්** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඒකකයක වරිපනම් හිඟය රු.50,000 ක් ඉක්ම වූ ඒකක 1,230 කින් ලැබිය යුතු රු.194,213,451 ක් විය. | හිඟ වරිපනම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මහා නගර සභා බල ප්‍රදේශය තුළ තක්සේරු දැන්වීම් බෙදා දීමේ දී, රු.219,958 ක හිඟ වරිපනම් ඒකක දේපළ 38 ක් හඳුනා ගෙන නොතිබුණි. | වරිපනම් ඒකක හඳුනා ගෙන වරිපනම් අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කර ගත යුතුය. |
| (iii) | 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය ප්‍රකාරව, වසර 05 කට වරක්වත් වරිපනම් දේපළ තක්සේරු කළ යුතු වුව ද, 2012 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත සමාලෝචිත වර්ෂය දක්වාම වරිපනම් අය කර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කරන බව. | කාලීනව වරිපනම් බදු තක්සේරු කළ යුතුය. |
| (ඇ) | **ජල බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.270,713,765 ක ජල ආදායම් හිඟයක් පැවති අතර, ඉන් ඒකකයක හිඟය රු.100,000 ඉක්ම වූ ජල පාරිභෝගිකයින් 32 කුගෙන් රු.8,748,648 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අය කර නොතිබුණි. | රතු නිවේදන යොමු කිරීම, දුරකථනය මඟින් ගෙවීම් කිරීමට පෙළඹවීම හා විසන්ධි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ජල ආදායම් අය කර ගත යුතුය. |
| (ii) | ජල ගාස්තු සම්බන්ධ පරිගණක පද්ධතියේ 1960 දරන ජල පාරිභෝගිකයාගේ දත්ත පද්ධතියට අවස්ථා 03 කදී එකතුව රු.1,557,691 ක් ගැලපීම් කර තිබුණ ද, ඊට අදාළ හේතු අනාවරණය නොවුණු අතර, එම ගැලපීමට අදාළ අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම වටිනාකම ගලපා බිල්පත් නිවැරදි කරන ලද බව. | ජල බිල්පත්වල ගැලපීම් නිවැරදිව කළ යුතුය. |
| (iii) | නියැදි පරීක්ෂණයට භාජනය වූ ජල පාරිභෝගිකයින් 12 දෙනෙකු මහා නගර සභාවට රු.2,708,313 ක ජල ගාස්තුවක් ගෙවා ඇති බවට සඳහන් කර ජල මෘදුකාංගයේ පාරිභෝගික හිඟයෙන් අඩු කර ඇතත්, අය කිරීම් සඳහා නිකුත් කළ ලදුපත් විගණනයට ඉදිරිපත් නොවුණි. | ගණකාධිකාරී (ගෙවීම්) වෙත තහවුරුවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. අදාළ ගණකාධිකාරී ගිණුම් හා ගෙවීම් වෙතින් ලබා දෙන වාර්තාව පදනම් කර ගෙන ශේෂයන් නිවැරදි කර ඉදිරිපත් කරන බව. | ලැබීම් ලදුපත්වලින් තහවුරු විය යුතුය. |
| (iv) | අංක 17791 දරන ජල පාරිභෝගිකයාගේ 2021 වර්ෂයේ ජූලි මාසයේ ජල බිල්පත් ගාස්තුව වූ රු.1,602,884 ක් ලෙස බිල්පත් නිකුත් වී ඇතත්, එය රු.524,478 ක් විය යුතු බවට ගණනය කර රු.1,078,366 ක මුදලක් අඩු කර බිල්පත සංශෝධනය කර ඇතත්, ඒ සඳහා අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට අය විය යුතු ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | සංශෝධනයන් සඳහා අනුමැතියක් තිබිය යුතු අතර, ලදුපත් ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | අංක 12162 දරන ජල පාරිභෝගිකයාගේ ජල සම්බන්ධතාව 2016 දී විසන්ධි කර නැවත ජල සම්බන්ධතාවය ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම අනුව, සන්ධි කිරීමේ ගාස්තු රු.1,000 ක් අය කර 2017 අගෝස්තු 02 දින ජල සම්බන්ධතාවය ලබා දී තිබුණි. එසේ වුව ද, ජල මෘදුකාංගයේ තොරතුරුවලට අනුව, 2017 අගෝස්තු 02 වන දින සිට 2019 අප්‍රේල් මාසය දක්වා ජල පරිභෝජනය සඳහා බිල්පත් නිකුත් කර ගාස්තු අය කර නොතිබුණි. ඒ අනුව, බිල් කරන ලද කාලයට අදාළ සාමාන්‍ය මාසික බිල් කිරීම රු.112,442 ක් ලෙස සැළකුවහොත්, බිල් නොකළ මාස ඒකක 20 ක් සඳහා රු.2,248,853 ක ජල ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ගිණුම්ගත නොවූ රු.2,248,853 ක ශේෂය අදාළ පාරිභෝගික ගිණුමට බැර කිරීමට කටයුතු කරන බව. | විධිමත්ව බිල් කර ජල ආදායම් අය කර ගත යුතුය. |
| (vi) | මහනුවර මහ රෝහලේ ජල සැපයුමේ සැප්තැම්බර් 14 දිනට රු.10,783,035 ක ජල හිඟයක් පරිගණක මෘදුකාංගය තුළ දක්වා තිබුණි. එසේ වුව ද, 2018 දී අධි ගාස්තු ලෙස අනුමැතියකින් තොරව රු.3,831,266 ක් හා "වැරදි පාරිභෝගික අංක 29363" ලෙස සඳහන් කර රු.2,536,717 ක් හිඟයෙන් අඩු කර තිබුණු අතර, 2008 මැයි ජල බිල්පතෙහි (ආරම්භක ජල බිල්පත) රු.1,110,140 ක ශේෂය හිඟයට එකතු කර නොතිබුණි. ඒ අනුව, මෙම වරදවා දැක්වීමේ හේතුවෙන්, මහනුවර මහා රෝහලේ ජල හිඟය රු.7,478,123 ක් අඩුවෙන් දක්වා තිබුණි. | රජයේ ආයතනවල අධි ගාස්තු ඉවත් කිරීමට අනුමැතිය දී ඇත. ඒ අනුව, ගැලපීම්වල නිවැරදිතාවය පරීක්ෂා කරන බවත්, 29363 දරන ජල සම්බන්ධතාවය ලබා දී ඇත්තේ අධ්‍යක්ෂ, මහ රෝහල නමින් බැවින්, ඒ සඳහා ගෙවූ රු.2,536,747 ක මුදල අංක 2402 බිල්පතින් අඩුවීම නිවැරදි කරන බව ද, වැරදි ගණනය කිරීම් නිවැරදි කරන බව. | අධි ගාස්තු අනුමැතිය ලබා ගෙන ඉවත් කළ යුතු අතර, හිඟයෙන් අඩු කිරීම් නිවැරදිව සිදු කර ජල බිල්පත් නිවැරදිව අය කළ යුතුය. |
| (vii) | නියැදි පරීක්ෂණය අනුව, නියමිත දිනට ජල ගාස්තු නොගෙවූ ජල පාරිභෝගිකයින් 07 දෙනෙකුගෙන් එකතුව රු.1,057,897 ක අධි ගාස්තු අය කර නොතිබුණි. | දින 14 ක් ඇතුළත බිල්පතට ගෙවීම් නොකළහොත්, අධි ගාස්තු එකතු කරන බව. | අධි ගාස්තු අය කළ යුතුය. |
| (ඇ) | **ඉඩම් බදු** | | |
| (i) | බදු පදනම මත ලබා දී තිබුණු ඖෂධ පැළෑටි සහිත භූමියේ ඉඩම හා මාවිල්මඩ පේෂකර්ම මධ්‍යස්ථානය පිළිවෙලින් 1986 න් පසුව හා 2014 වර්ෂයෙන් පසුව තක්සේරු කරවා ගෙන නොතිබුණි. බදු දී තිබුණු පේෂකර්ම මධ්‍යස්ථානය සඳහා 2013 සිට 2021 නොවැම්බර් 11 වන දින දක්වා රු.1,733,333 ක මුදලක් ද, ඖෂධ පැළෑටි සහිත භූමිය සඳහා 2006 සිට 2021 දක්වා ඉඩම හා ගොඩනැගිල්ල සඳහා රු.19,200 ක මුදලක් ද වශයෙන් රු.1,752,533 ක බදු කුලී අය කර ගෙන නොතිබුණි. | ඉඩම හා පේෂකර්ම මධ්‍යස්ථානය සඳහා හිඟ මුදල් මසක් තුළ ගෙවන ලෙස 2023 මැයි 29 දින බදුකරු දැනුවත් කර ඇති බව. | හිඟ බදු කුලී කාලීනව අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2002 අගෝස්තු 29 දිනැති අංක 1249 දරන ගැසට් නිවේදනයේ සඳහන් මහනුවර මහා නගර සභා අතුරු ව්‍යවස්ථාවේ 13(1) ට අනුව, කටයුතු කර මහා නගර සභාව විසින් බදු දී තිබුණු බෝවල ප්‍රදේශයේ ඉඩම් කැබලි 99 කින් 2017 වසරේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ එකතුව රු.9,473,250 ක බදු මුදල් අය කර නොතිබුණු අතර, අදාළ බදුහිමිකරුවන් සමඟ ගිවිසුම්ගත වීමට ද කටයුතු කර නොතිබුණි. | ඉඩම් කට්ටි 21 ක් සඳහා මේ වන විට ගිවිසුම්ගත වී ඇති අතර, ඉතිරි ඉඩම් කට්ටි සඳහා ගිවිසුම්ගත වීමට කටයුතු කරමින් පවතී. එලෙසම හිඟ බදු මුදල් අය කර ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | බදුකරුවන් සමඟ ගිවිසුම්ගත වී හිඟ බදු මුදල් අය කර ගත යුතුය. |
| (iii) | 2013 ජූලි 11 දිනැති අංක 2013/06 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව, ඉඩම් බදු දෙපළවලින් නොදියුණු වටිනාකම ඇතුළත් කර බදු මුදල් අය කළ යුතු වුවත්, බදු දුන් ඉඩම් 599 කින් 2008 වර්ෂයේ තක්සේරු වාර්තාවට අනුව 2012 සිට 2021 දක්වා කාලයට අදාළව එකතුව රු.58,268,525 ක බදු කුලී අය කර නොතිබුණි. | 2012 වර්ෂයෙන් පසුව ඉඩම් බදු බිල් කිරීම සිදු කර නොමැත. 2013 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා හිඟ ශේෂ ගණනය කර 2023 වර්ෂයේ සිට වාර්ෂික බිල් කිරීම් සිදු කර හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු සිදු කරන බව. | ඉඩම් බදු මුදල් කාලීනව අය කර ගත යුතුය. |
| (iv) | 2012 වර්ෂයට පෙර සිට බෝගම්බර පිඹුරු අංක 196,197 හා 100 යටතේ බදු දුන් ඉඩම් කොටස් 43 ක බදු කුලී තක්සේරු කර නොතිබුණු අතර, එම කාලයට අදාළ බදු කුලී අය කර ද නොතිබුණි. | මෙම ඉඩම් සඳහා 2012 වර්ෂය වන විට බිල් කිරීම් සිදු වී නොමැති අතර, ඊට හේතු වූ කරුණු ලිපිගොනුවලින් සොයාගත නොහැකි විය. බදු මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | බදුකරුවන් සමඟ ගිවිසුම්ගතව කාලීනව බදු මුදල් අය කළ යුතුය. |
| (ඉ) | **කුලී**<br>බෝගම්බර වෙළඳ සංකීර්ණයේ වසර 04 ක සිට හිඟව පවතින කඩ කාමර 45 කින් රු.7,034,650 ක් කඩ කුලී අය කර නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කඩ කුලී අය කළ යුතුය. |
| (ඊ) | **වෙනත් ආදායම්**<br>සමාලෝචිත වර්ෂයේ එකතුව රු.3,033,812 ක දැන්වීම් පුවරු 390 ක සංඛ්‍යාවක් සමීක්ෂණ කටයුතුවලදී අත්හැරී තිබුණු අතර, සමීක්ෂණ වාර්තාවේ සඳහන් දැන්වීම් පුවරු සම්බන්ධව භෞතිකව සිදු කළ පරීක්ෂාවේ දී, එසේ හඳුනාගත් විශාල දැන්වීම් පුවරු 11 ක ගාස්තු රු.1,037,512 ක් අඩුවෙන් දක්වා තිබුණි. වාර්ෂිකව දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර මාර්තු 31 දිනට පෙර විෂයභාර නිලධාරියාට භාර දිය යුතු වුවත්, සමීක්ෂණ වාර්තා නියමිත දිනට භාර දී නොතිබුණි. | ස්ටිකර් මෙතෙක් දැන්වීම් පුවරු ලෙස සමීක්ෂණය නොකළ අතර, මින් ඉදිරියට ඒවා ද දැන්වීම් පුවරු සේ සලකා කටයුතු කරමි. දැන්වීම් පුවරු 390 ක් සඳහා බිල් කිරීම් කර ගාස්තු අය කිරීමට කටයුතු යොදා ඇති බව | සමීක්ෂණය කර දැන්වීම් පුවරු ආදායම් අය කළ යුතුය |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු මුද්දර ගාස්තු රු.72,261,900 ක් විය. | තවදුරටත් අය විය යුතු මුද්දර ගාස්තු අය කර ගන්නා බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2007 වර්ෂයේ දී, ඩී.එස්. සේනානායක මහජන පුස්තකාල ශ්‍රවණාගාරය ගින්නකින් විනාශවීම සම්බන්ධව සිදු කළ මු.රෙ. 104 පරීක්ෂණය ප්‍රකාරව අය කළ යුතු රු.31,250,000 ක මුදල වගකිව යුතු පාර්ශවවලින් අය කර ගෙන නොතිබුණි. | මහා නගර සභා ආඥා පනතේ 254අ(2) වගන්තිය අනුව, මුදල් අය කර ගැනීමේ බලය නාගරික කොමසාරිස් සතු වන බවත්, පළාත් පාලන කොමසාරිස් ප්‍රධානත්වයෙන් පත් කළ කමිටුව දන්වා ඇත. අධිහාර ගෙවන ලෙස දන්වා 2022 සැප්තැම්බර් 19 දිනැති ලිපියෙන් එම නිලධාරීන් වෙත නාගරික කොමසාරිස්ගේ අත්සනින් ලිපි යවන ලද බව. | මුදල් රෙගුලාසි 104 පරීක්ෂණවලින් තීරණය කළ අලාභ අය කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | නාගරික රථගාලේ ඉහළ මහලේ අංග 05 කින් යුතු එළිමහන් උද්‍යානය (සහස් උයන) කඩ කාමර තක්සේරු කිරීමකින් තොරව ව්‍යාපෘති වාර්තාවක් මත එය මෙහෙයවීම, කළමනාකරණය, නඩත්තුව සඳහා මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ බදු දීමට කටයුතු කර තිබුණි. වර්ෂ 03 කට හෝ 05 කට වරක් තක්සේරු කර බදු කුලී අය කළ යුතු වුවත්, එසේ කටයුතු නොකර වසර 15 කටම බදුකරුගෙන් වර්ෂයෙන් වර්ෂයට ගන්නා බදු මුදල ටෙන්ඩර් කර තිබුණි. පළමු වර්ෂයට රු.280,000 ක මුදලක් ද, ආදී වශයෙන් ඉතා අඩු මුදලකට වැඩි වන ආකාරයට වසර 15 කට රු.5,265,089 ක මුදලකට ටෙන්ඩරය පිරිනමා තිබුණි. | 2021 හා 2022 යන වර්ෂයන් හීදි තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරුවක් ලබා ගැනීමට ඉල්ලීම් කළ ද, තක්සේරු වාර්තා මේ වන විටත් ලැබී නොමැත. ඒ අනුව, මහා සභා අනුමැතිය මත ටෙන්ඩර් කර බදු දී ඇති බව. | තක්සේරු වාර්තා ලබා ගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මෙම ව්‍යාපෘතිය භෞතික පරීක්ෂාවේ දී, එහි උපයෝජනය හා ආදායම් අය කිරිම පිළිබඳ පරීක්ෂාවේ දී, බදුකරු විසින් මසකට රු.5,539,179 ක පමණ ආදායමක් උපයා තිබුණ ද, මහා නගර සභාවට මාසිකව බදු ලෙස ලබා දී තිබුණේ රු.280,000 ක ආදායමක් බව අනාවරණය විය. | මෙම පරිශ්‍රය මෙහෙයුම් කල් බදු යටතේ වර්ෂ 15 කට බදු දී ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා බදු දීමේ යෝජනා කෙටුම්පත් සකස් කළේ 2021 වර්ෂයේ මුල් භාගයේ බැවින්, එම කාලයේ පැවැති ආර්ථික, මූල්‍ය සමාජ පසුබිම වර්තමාන තත්ත්වයට වඩා බෙහෙවින්ම වෙනස් බව. | තක්සේරු වාර්තා ලබා ගෙන නිවැරදි කළ යුතුය. |
| (ඇ) | නගර මධ්‍යයේ පිහිටි සහස් උයන පරිශ්‍රයේ වෙළඳ කුටි 100 ක් ඉදිකර ඒ සඳහා ව්‍යවසායකයින් 127 ක් ලියාපදිංචි කර දෛනික පදනමින් එම ව්‍යවසායකයින්ට ව්‍යාපාරවල යෙදීමට ඉඩකඩ ලබා දී තිබුණි. ඒ අනුව, 2022 ජූලි 07 දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ එම පරිශ්‍රයේ වෙළඳ කුටි 100 න් රු.4,160,000 ක ආදායමක් දළ වශයෙන් ලබා ගත යුතු වුවත් වෙළඳ කුටි 100 උපයෝජනය වන ආකාරයට වැඩ පිළිවෙලක් සැලැසුම් කර නොතිබීම හේතුවෙන්, 2022 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාළව රු.2,499,800 ක ආදායමක් සභා අරමුදලට අහිමි වී තිබුණි. සහස් උයන පරිශ්‍රයේ වෙළඳ කුටි 100 ක් ඉදිකර තිබුණ ද, ඉන් මහා නගර සභාවට වෙන් කර තිබුණු වෙළඳ කුටි 03 ක් ඇතුළුව වෙළඳ කුටි 60 ක් පමණ 2022 ජූලි 07 දින සිට වසා දමා තිබුණි. | සියලු ව්‍යවසායකයින්ට අවස්ථාව ලැබෙන පරිදි දෛනික පදනමට මුදල් ගෙවා වෙළඳ කුටි ලබා දීමට කටයුතු කර ඇත. නමුත්, ඇතැම් ව්‍යවසායකයින් මුදල් ගෙවා වෙළඳ කුටි වෙන් කරවා ගත්ත ද, ඒවා තුළ වෙළඳ කටයුතු සිදු නොකිරීම නිසා, වෙළඳ කුටි වසා තැබීමට සිදු වන අවස්ථා ද ඇත. දැනට බලාපොරොත්තු වන ආදායම මෙම වෙළඳ කුටිවලින් නොලැබෙන බැවින්, මූලික සංකල්පයට හානි නොවන පරිදි ටෙන්ඩර් කර බදු ලබා දීමට කටයුතු කර ඇති බව. | සියලු වෙළඳ කුටි උපයෝජනය වන පරිදි සැලැසුම් සකස් කළ යුතුය. |
| (ඈ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 01(vi) වගන්තිය ප්‍රකාරව, කටයුතු නොකර, ටොම්ලින් උයන පැරණි කඩහිමියන් 13 දෙනෙකුට එකවර මුදල් අය නොකර දීර්ඝකාලීනව බදු ලබා දීමට කටයුතු කර තිබුණි. ඒ අනුව, රු.35,400,000 ක එක්වන් මුදලක් මහා නගර සභාව වෙත අහිමි වී තිබුණි. 2022 මැයි 23 දිනැති අංක KD/RP/4252 දරන ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වාර්තාව අනුව, 2022 අගෝස්තු 01 දින සිට ගෙවීමට කටයුතු කටයුතු කළ යුතු වුවත්, ඒ අනුව කුලී නොගෙවීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,647,195ක කඩ කුලියක් හිඟව පැවතුණි. | එක්වන් මුදලක් අය කර නොමැති බවත්, කඩ කාමර චක්‍රලේඛ හා 2021 නොවැම්බර් 19 දිනැති අංක 08(23) සභා සම්මුතිය අනුව, කටයුතු කර ඇති බව සඳහන් කර ඇත. අදාළ බදුකරුවන් විසින් නව තක්සේරු කඩ කුලිය විශාල මුදලකින් වැඩි වී ඇති බැවින්, කඩ කුලී අඩු කර දෙන මෙන් ඉල්ලීම් කර ඇත. නමුත්, නව තක්සේරු වාර්තාවට අනුව, කඩ කුලී බිල් කිරීම සිදු කරනු ලබන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | මහා නගර සභාව සතු අරුප්පල ශාඛා පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත නොහැකිව නිෂ්කාර්යයව පවතින බව නිරීක්ෂණය විය. | ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කරන බව. | සභාව සතු වත්කම් උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවැති ගෙවිය යුතු ගිණුම් ශේෂ 07 ක එකතුව රු.1,306,347,907 ක් වූ අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.776,028,241 ක් හා වසර 05 ට වඩා වැඩි කාලයක් ඉක්ම වූ ගිණුම් ශේෂවල එකතුව රු.50,443,104 ක් නිරවුල් කර නොතිබුණි. | විවිධ ණයහිමි, පොදු, ජල හා වැටුප් ණයහිමි ශේෂයන්ගේ වසර 01 ත් 05 ත් අතර පවතින ශේෂය ඉදිරියේ දී සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය. |
| (උ) | ලංකා විදුලි බල මණ්ඩලයෙන් අය කිරීමට තිබෙන වැඩ ලෙස රු.48,599,525 ක ශේෂයක් ගිණුමේ දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණ ද, එම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂය නිරවුල් කර ගත යුතුය. |

3.3 **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අප ජල ව්‍යාපෘතිය සඳහා ලබා දී තිබුණු රු.8,067,600 ක බොබ් කැබ් රථය 2019 අගෝස්තු 23 වන දින ලැබී තිබුණු අතර, එය 2022 සැප්තැම්බර් 10 වන දින දක්වාම සේවයේ යොදවා නොතිබුණි. | බහුතරයක් වාහන හදිසි අප ජල පිටාර ගැලීම් හා අවහිරතාවලට භාවිතා කරන බව | වත්කම් ඵලදායීව උප යෝජනය කළ යුතුය |
| (ආ) | සභාව පරිහරණය කරන රු.107,860,200 ක වාහන 10 ක් ප්‍රමාණවත්ව උපයෝජනය නොවන බව කරන ලද විගණනයේ දී නිරීක්ෂණය විය. | වාහන ප්‍රයෝජනයට ගැනිමට කටයුතු කරන බව | වාහන ඵලදායීව උපයෝජනය කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවැති රු.2,950,000 ක ලී බඩු හා පුස්තකාල පොත් හා රු.19,236,800 ක වාහන හා යන්ත්‍ර උපකරණ 06 ක් 2016 සිට 2020 දක්වා කාලයක සිට නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | වාහන 06 ක කාර්මික දෝෂ අධික බැවින්, කාර්මික වැඩ පොළට යොමු කිරීමට ද, ඇතැම් වත්කම් ප්‍රයෝජනවත් ලෙස යොදා ගන්නා බවට ද, වෙන්දේසි කළ යුතු වත්කම් වෙන්දේසි කරන බව | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය |

3.4 **වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| | **පවරා නොගත් වත්කම්** | | |
| (අ) | අප ජල ව්‍යාපෘතිය මඟින් සභාවට ලබා දී තිබුණු රු.169,768,600 ක වාහන 31 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මහා නගර සභාව නමින් ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස දන්වා 2022 ජූනි 09 වන දින ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත ලිපියක් යොමු කර ඇති බව | වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් අරුප්පල පිහිටි ජාතික නිවාස සංකීර්ණයෙන් නිවාස 10 ක් රු.1,700,000 කට 1993 වර්ෂයේ දී මිලදී ගෙන තිබුණ ද, එහි අයිතිය පවරා ගෙන නොතිබුණි. | මෙම නිවාස 10 පිළිබඳව කමිටුවක් පත් කර ක්‍රියාමාර්ග ගන්නා බව. පවරා ගැනීමට කටයුතු කරන බව | සභාව සතු රජයේ නිවාසවල අයිතිය පවරා ගත යුතුය |

3.5 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **නාගස්තැන්න පාර, අංක 97/ඒ, අසළ ආරක්ෂක බැම්ම ඉදිකිරීම හා කඩා යාම පිළිබඳ පරීක්ෂාව - රු.1,516,014** | | |
| i. | ඉකුත් වර්ෂයේ ඉදිකරන ලද ආරක්ෂිත බැම්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 26 දින පෙරළී විනාශ වී තිබුණි. | ඉදිරියේ දී බැම්ම කඩා ඉවත් කරනු ලබන අතර, ඉන් පසු හානී වූ නල පද්ධතිය නැවත ඉදිකරන බව. | හානිවීම් සම්බන්ධ පරීක්ෂණ පවත්වා අලාභ හානි සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් පිළිබඳව කටයුතු කළ යුතුය. |
| ii. | ආරක්ෂක බැම්ම සම්බන්ධ 2021 පෙබරවාරි 28 දින අනුමත කළ සැලැසුම තිබිය දී, ඒ වෙනුවට තාක්ෂණික නිලධාරී පිළියෙල කළ, ඉංජිනේරුවරයා අනුමත නොකළ වෙනත් සැලැසුමකට අනුව බැම්ම ඉදිකර තිබුණි. | මෙම ස්ථානයේ මාර්ගයට යාබදව ඇල්ල කොටස නාය යාම හේතුවෙන්, මාර්ගයට සිදු වන බලපෑම නැති කිරීම සඳහා මාර්ගය නිසි පරිදි සකස් කිරීම හේතුවෙන්, ඇල්ල සංරක්ෂණය කිරීම සඳහා මෙම ඇස්තමේන්තුව සකස් කරන ලද බව. | විධිමත් අනුමැතියකට යටත්ව කටයුතු කළ යුතුය. |
| iii. | බැම්මේ මුලු උස අඩි 16 ක් වන අතර, එයින් අඩි 14 අඟල් 06 ක ප්‍රමාණයක් පොළොව මතුපිට නිරීක්ෂණය විය. ඒ අනුව, පොළොව මට්ටමේ සිට අත්තිවාරම දක්වා අඩි 1 ½ ක පමණ ප්‍රමාණයක් පොළොව යට ඉදිකර තිබුණි. විෂයය අංක 02 හා 03 යටතේ පස් ඝණ මීටර් 45 ක් ඉවත් කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබූ අතර, එහි ගැඹුර අඩි 06 ක් පස් ඉවත් කර බැම්ම ඉදිකළ යුතු වුව ද, අඩි 2 ½ ක් පමණක් පස් ඉවත් කර බැම්ම ඉදිකර තිබුණි. එසේම, විෂයය අංක 12 යටතේ බැම්ම ඉදිකර පස් පිරවීම සඳහා (Back Filling) මීටර් කියුබ් 148 ක් ප්‍රවාහනය කර පස් පුරවා තැලිය යුතු වුවත්, එසේ නොකිරීම, විෂයය අංක 08 හි Weep Hole 15 ක් සඳහා Filter Area හා Foot Base සකස් කිරීමක් සිදු නොකර, Weep Hole පමණක් යොදා තිබුණි. එසේ අනුමත ඇස්තමේන්තුවට පරිබාහිරව කටයුතු කිරීම හේතුවෙන්, මෙම | විශේෂ ව්‍යාපෘතියේ රාජකාරී කළ වැඩ අධිකාරී විශ්‍රාම ගොස් ඇත. කලාප 03 ඉංජිනේරු විසින් ලබා දී ඇති සැලැස්මට අනුව ඉදිකිරීම් සිදු කර ඇති බව හා කොන්ක්‍රීට්වල ප්‍රමිතිය පවත්වා ගෙන ඇති බව තහවුරු කර ඇත. Weep Hole ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බව | අනුමත ඇස්තමේන්තු ගත ප්‍රමිතීන්ට හා පිරිවිතරවලට අනුව මනා අධීක්ෂණයකින් වැඩ ඉටු කරවා ගත යුතුය |

| | | | |
|---|---|---|---|
| | ආරක්ෂිත බැම්ම පෙරළී මහා නගර සභාවට රු.1,516,014 ක අලාභයක් සිදු කර තිබුණි. | | |
| iv. | ආරක්ෂිත බැම්ම කඩා වැටීම හේතුවෙන්, මෑතක දී ඉදිකරන ලද ජලාපවාහන පද්ධතියක් සම්පූර්ණයෙන්ම හානි වී තිබූ බවත්, එයට ද වන්දියක් ගෙවීමට සිදු වීමේ ඉඩකඩ බැහැර කළ නොහැකි බැවින්, හා පෙරළී ගිය බැම්ම ඉවත් කිරිමට අධික පිරිවැයක් දැරීමට ද සිදු වන බවත් නිරීක්ෂණය විය. | හානි වූ නළ පද්ධතිය නැවත ඉදිකිරීමට කටයුතු කරන බව | වගකිව යුතු පාර්ශව සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය |
| (ආ) | **ක්‍රීඩා පිට්ටනි සඳහා සූර්යයබල වීථි පහන් ඉදිකිරීම - රු.1,612,000** | | |
| | මෙම කර්මාන්තයේ භෞතිකව ඉදිකර තිබුණු ප්‍රමාණයන් සැලකිල්ලට ගෙන කණුව සමඟ සෝලා පැනලයක් සඳහා ගෙවිය යුතු වටිනාකම රු.46,546 ක් ලෙස සැලකීමේ දී, කණුව සහිත සූර්යය පැනල් 13 ක් සඳහා රු.605,098 ක් ගෙවිය යුතු වුව ද, එසේ සලකා බැලීමකින් තොරව ගිවිසුම්ගත මුදල වූ රු.1,612,000 ක් සූර්යය බල වීථි පහන් කණු 13 ක් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි. මේ හේතුවෙන්, රු.1,006,902 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | ආයතන 02 ක් පාදම සමඟ වීථි පහන් කට්ටලය සඳහා පිරිවිතර හා සාම්පල් ලබා දී නොතිබුණි.මිලි මීටර් 50 GI බටය පොළොව මට්ටමේ සිට මීටර් 08 ක් උසින් ලාම්පු සවි කිරීමට පිරිවිතර ලබා දුන්න ද, නඩත්තු කටයුතු සඳහා අපහසු බැවින්, උස මීටර් 6.5 ට සවි කිරීමට කොන්ත්‍රාත් ආයතනයට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව, ඒ සඳහා වැඩිපුර ගෙවා ඇති මුදල එම ආයතනයට ඉදිරියේ දී ගෙවීමට ඇති මුදලින් අඩු කිරීමට කටයුතු කරමින් පවතී. කොන්ත්‍රාත්කාර ආයතනය විසින් ලබා දුන් සැලැසුමේ පාදමේ දිග හා පළල සඳහන් කර නොතිබුණු බැවින්, දුරකථනයෙන් විමසූ විට පාදම 1'x 1' ප්‍රමාණයෙන් යොදන බව සඳහන් කළ බව. | සාධාරණීකරණ වාර්තා පිළියෙල කර අනුමැතිය ලබා ගත යුතුය. අවශ්‍යතාවය සලකා බලා ඇස්තමේන්තු පිරිවිතර පිළියෙල කර මනා අධීක්ෂණයෙන් වැඩ ඉටු කරවා, ඉටු කරන ලද වැඩ පරීක්ෂා කර ඒ අනුව ගෙවීම් නිර්දේශ ලබා ගෙන ගෙවීම් කළ යුතුය |

3.7 **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **සේවක පුරප්පාඩු හා අතිරික්ත**<br>සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 70 කට අදාළව පුරප්පාඩු 491 ක් හා තනතුරු 03 කට අදාළ අතිරික්ත සේවකයින් 33 ක් පැවතුණි. | චක්‍රලේඛ අනුව, මේ වන විට බඳවා ගැනීම් අත්හිටුවා ඇත. අවශ්‍යතාවය අනුව පුරප්පාඩු සම්පූර්ණ කර ගන්නා බව. | පුරප්පාඩු පුරවා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) **සේවක ණය**<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 126 කගේ හා වැඩ තහනමට ලක් වූ හා සේවය අතහැර ගිය නිලධාරීන් 43 කගේ වසර 02 ත් 24 ත් අතර කාලයක සිට පැවැති එකතුව රු.16,217,899 ක හිඟ ණය ශේෂය අය කර නොතිබුණි. | අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ණය ශේෂ අය කළ යුතුය. |